**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2008/2009**

**පවුල් නීතිය - LWU 2313**

**කාලය පැය 03 යි.**

---

දිනය - 2009 මාර්තු 25 වන දින වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න පහකට (5) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. නිදහසින් පසු කාලපරිච්ඡේදයේදී සිදු වූ ප්‍රත්‍යක්ෂ ප්‍රවණතාවයක් වන්නේ, ඉස්ලාම් නීතියේ මූලික මූලධර්මයන් කෙරෙහි නැඹුරු වෙමින් සාමාන්‍ය නීතිය මුස්ලිම්වරුන්ට අදාල වීම බැහැර වීමයි.

    මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පැනවීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතිය අදාල වීම සම්බන්ධයෙන් සිදු වූ ව්‍යවස්ථාදායක සහ අධිකරණ වර්ධනයන් පැහැදලි කරන්න.

02. සුපුන් සහ නටාෂා යනු සුපුන් විසින් කුලියට ගන්නා ලද කාමරයක එක්ව වාසය කල අවිවාහක යුවලකි. තමා ගැබ්ගෙන ඇති බවත් ඔවුන් විවාහ විය යුතු බවත් නටාෂා 2001 දී සුපුන්ට දන්වා සිටියාය. සුපුන් එකඟ වුවත් ඔහු කියා සිටියේ තමා කතෝලිකයකු වන බැවින් තම විවාහ උත්සවය කතෝලික පල්ලියකදී සිදු කළයුතු බවයි. සුපුන්ගේ මිතුරන් කොළඹ පිහිටි කතෝලික පල්ලියක විවාහ උත්සවය සංවිධානය කළහ. විවාහ උත්සව දිනයේදී දෙපාර්ශ්වය මිතුරන් කිහිප දෙනෙකු ද සමග පල්ලියට ගියහ. පල්ලියේ එකම පූජකවරයා අසනීප තත්ත්වයෙන් පසුවූ නිසා පැමිණ නොසිටි අතර, දෙදෙනා යාඥාවන් සිදුකර මිතුරන් ඉදිරියේ මුදු හුවමාරු කර ගත්හ. ඉන් අනතුරුව දෙදෙනා අඹු සැමියන් වශයෙන් ජිවත් වූහ. 2002 දී නටාෂාට දරුවකු ලැබුණු අතර ඇය චමිලා නම් විය.

    බැංකුවක විධායක තනතුරක රාජකාරී බාර ගැනීම සඳහා 2008 දී සුපුන් ත්‍රිකුණාමලයට පිටත්ව ගියේය. මසකට දෙවරක් නටාෂා සහ චමිලා බැලීම සඳහා කොළඹ පැමිණීමට ඔහු පුරුදුව සිටියේය. පසුව, ඔවුන් බැලීමට ඔහු පැමිණෙන වාර ගණන අඩු විය. නටාෂා මේ පිළිබඳව විමසූ විට, ඇය සමඟ කෝප වූ සුපුන් නැවත ත්‍රිකුණාමලයට පිටත්ව ගියේය. ඔහු නටාෂාට මුදල් එවීම නතර කළේය. නිවාස කුළී ගෙවීමට සහ චමිලාගේ නඩත්තුව සඳහා නටාෂාගේ මාසික වේතනය ප්‍රමාණවත් නොවන බැවින්, කවර ක්‍රියාමාර්ගයන් ඇයට ලබාගත හැකිදැයි ඇය ඔබගෙන් උපදෙස් පතයි.

    නටාෂාට උපදෙස් දෙන්න.

03. විශ්ව සහ කමලනී 1970 සිට යාපනයේ ජීවත් වන පවුල් දෙකක දරුවන් වූහ. කමලිනීගේ පියා විසින් ගෙන එන ලද යෝජනාවකට අනුව විශ්ව සහ කමලනී අතර විවාහය 2000 දී ලියාපදිංචි කරන ලදී. කමලනීගේ පියා, විවාහයෙන් දින දෙකකට පසුව ඇගේ දෑවැද්ද වශයෙන් කන්කසන්තුරයේ පිහිටි අක්කර 2 කින් යුත් ඉඩමක් ඇයට පවරන ලදී. 2001 දී අන්තිම කැමති පත්‍රයක් තබා මිය ගිය සිය සීයාගෙන් යාපනයේ පිහිටි මහල් තුනකින් යුත් ගොඩනැගිල්ලක් විශ්වට උරුම විය. 2003 දී කමලනී නිවුන් දැරියන් බිහි කළාය. විශ්ව, ගොඩනැගිල්ල කුලියට දීමෙන් ලබාගත් ආදායමෙන් බයිසිකල් ටයර් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් අත්කර ගත්තේය. 2005 දී යාපනයේ පිහිටි ගොඩනැගිල්ල විකුණා දැමූ විශ්ව යාපනයේ පිහිටි මනිපේ හි ඉඩම් අක්කර 25 ක් මිරිස් වගා කිරීම සඳහා මිළදී ගත්තේය. 2009 දී විශ්ව ආයුධ සන්නද්ධ කණ්ඩායමකගේ වෙඩි පහරකට ලක් විය. ඇයගේ සහ ඇගේ දියණියන් දෙදෙනාගේ අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳව දැන ගැනීමට කමලනී කැමැත්තෙන් සිටී.

(අ) කමලනීට උපදෙස් දෙන්න.

(ආ) සියළුම පාර්ශ්වයන් උඩරට සිංහලයන් වූයේ නම් සහ දේපළ උඩරට ප්‍රදේශයේ පිහිටා තිබුණේ නම් ඔබේ පිළිතුර වෙනස් වේද ?

04. දරුවාගේ සැබෑ පියා නොවන තැනැත්තෙකුට පිතෘත්වය නොපවරා නිවැරදි පුද්ගලයාට පිතෘත්වය පවරා දීමෙන් දරුවාගේ උපරිම යහපත ළඟා කර ගත හැකිය.

විවාහජත්වයේ පූර්ව නිගමනයෙහි ඓතිහාසික වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව අගය කරන්න.

05. ජගත් සහ කළ්‍යාණි සිය විවාහය 1998 දී ලියාපදිංචි කලහ. 1999 දී සහ 2001 දී ඔවුන්ට දරුවන් දෙදෙනකු ලැබුණි. ජගත් සහ කළ්‍යාණි සාමකාමීව ජීවත් නොවූ අතර සුළු කරුණකට පවා එකිනෙකා අතර ආරවුල් ඇති කර ගත්හ. ජගත් සමග ජීවත්වීම දුෂ්කර බව අවබෝධ කරගත් කළ්‍යාණි දරුවන් දෙදෙනාද සමග තම දෙමාපියන් සමඟ ජීවත්වීමට ගියාය. 2008 දී ජගත්, දරුවන්ගේ භාරකාරත්වය ඉල්ලමින් අධිකරණයෙහි නඩුවක් පැවරුවේය. ඔහුට දරුවන්ගේ භාරකාරත්වය ලැබුණු අතර කළ්‍යාණිට ඔවුන් වෙත ප්‍රවේශ අයිතිය ලැබුණි. කළ්‍යාණි කොළඹ රැකියාවක් සොයාගත් අතර 2008 අගෝස්තු මාසයේ සිට සේවය කිරීම ආරම්භ කළාය. සෑම මසකදීම ඇය දරුවන් බැලීමට ගිය අතර දුරකථනයෙන් ඔවුන් සමග සම්බන්ධතා පවත්වාගෙන යාම කිසි දිනෙක අතපසු නොකළාය.

දරුවන් මුණ ගැසුනු එක් දිනකදී, වැඩිමහල් දරුවා කියා සිටියේ සුමනා නම් වෙනත් කාන්තාවක් ජගත් විසින් නිවසට ගෙනවිත් ඇති බවත් ඇය ඔවුන්ව නොසලකා හරින බවත්ය. ඇය තවදුරටත් කළ්‍යාණිට දක්වා සිටියේ ජගත් මත්පැන් පානය කර නිවසට පැමිණෙන බවත් සුමනා සමග ආරවුල් ඇති කර ගන්නා බවත්ය.

දරුවන්ගේ භාරකාරත්වය ප්‍රතිශෝධන අයදුම්පතක් මගින් නැවත සැලකිල්ලට ගත හැකියැයි උපකල්පනය කර, දරුවන් දෙදෙනාගේ භාරකාරත්වය සම්බන්ධ කාරණය පිළිබඳව නෛතික මතයක් ලියා දක්වන්න.

06. කාන්තා ප්‍රඥප්තිය, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනු ලැබුවේ වුවද, කාන්තාවන්ගේ දේපළ අයිතිවාසිකම් පිළිබඳව ක්ෂේත්‍රය, සමානාත්මතාවය සඳහා කාන්තාවන්ට ඇති අයිතිවාසිකම් නිරන්තරයෙන්ම උල්ලංඝනය කරන ක්ෂේත්‍රයක් බවට තවමත් ශේෂව පවතී.

(අ) අදහස් දක්වන්න.
(ආ) දේපළ අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ පවත්නා වෙනස් කොට දැක්වීම් ඉවත් කර දැමීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන නිශ්චිත යෝජනා මොනවාද ?

07. දර්ශාගේ මාමා විසින් 1995 දී, ප්‍රේමදාස සහ දර්ශාගේ විවාහය සංවිධානය කළේය. විවාහයෙන් පසුව, තම භාර්යාව විදේශීය දුරකථන අංකයක් සඳහා විශාල දුරකථන ඇමතුම් ප්‍රමාණයක් ලබා ගෙන ඇති බව ප්‍රේමදාස දැන ගත්තේය. ප්‍රේමදාස විසින් දර්ශාගෙන් ප්‍රශ්න කරන විට, ඇයට සිය ඥාති සොහොයුරා සමඟ ප්‍රේම සබඳතාවයක් තිබූ බවත් ඇගේ කැමැත්තට එරෙහිව ඇය ප්‍රේමදාස සමඟ විවාහ වූ බවත් හෙළිදරව් කළාය. අතීතය අමතක කර දමන මෙන් ඇගෙන් ඉල්ලා සිටි ප්‍රේමදාස, ඇගේ කලින් පෙම්වතාට දුරකථන ඇමතුම් ලබාදීම ඇය විසින් දිගින් දිගටම සිදු කළහොත් නැවත ඇගේ දෙමාපියන් වෙත ඇය යවන බවට ද අනතුරු ඇඟෙව්වේය. ඉන් අනතුරුව ප්‍රේමදාස සමඟ කථා කිරීම දර්ශා නවතා දැමුවාය. තම ස්වාමිපුරුෂයා සමග රාත්‍රී ආහාරය ගැනීමෙන් ද ඇය වැළකී සිටියාය. අවස්ථා ගණනාවකදීම රාත්‍රී ආහාරය සකස් කොට නැති බව දැනගත් ප්‍රේමදාසට හෝටලයකින් ආහාර මිළයට ගැනීමට සිදුවිය. ප්‍රේමදාස සමග එකම කාමරයක වාසය කිරීම නතර කළ දර්ශා පහත මාලයේ කාමරයක ජීවත්වීමට ගියාය.

දර්ශා කිසිවෙකු සමග පැයකට අධික කාලයක් කථාකරමින් සිටි බව සේවකයකු මගින් දිනක් ප්‍රේමදාස දැනගත්තේය. ඔහු විසින් ප්‍රශ්න කිරීමේදී, ඔහුට මල් බඳුනකින් පහර දුන් ඇය ඇගේ සියළුම බඩු බාහිරාදියද රැගෙන නිවසින් පිටවූවාය. වෙනත් අයකු සමගින් සිය භාර්යාව ප්‍රේම සබඳතාවයක් පවත්වන බව කිසිවෙකුට ඒත්තු ගැන්වීමට ප්‍රේමදාසට අවශ්‍ය නැත. ඔහුට ලබාගත හැකි නඩු නිමිත්ත කවරේද ?

ප්‍රේමදාසට උපදෙස් දෙන්න.

08. ඔස්මන්ඩ් යනු 1985 දී එක්සත් ජනපදයට සංක්‍රමණය වී 1995 දී එහි පුරවැසි භාවය ලබාගත් ශ්‍රී ලාංකිකයෙකි. ශ්‍රී ලංකාවේ පුරවැසි භාවය එම වසරේදීම ඔහුට අහිමි විය. කෙසේ වුවත්, ඔහු වසරකට දෙවරක් ලංකාවට පැමිණි අතර, 2005 දී නාත්තන්ඩියේ පදිංචි ඉරේෂා සමග විවාහ වී නැවත එක්සත් ජනපදයට පිටත්ව ගියේය. දෙදෙනාම දැන් ඇමරිකානු පුරවැසියන්ය. ඔවුනට දරුවන් නොමැති නිසා ශ්‍රී ලංකාවෙන් දරුවකු දරුකමට හදා ගැනීමට ඔස්මන්ඩ් හා ඉරේෂා තීරණය කළහ. දරුවකු දරුකමට හදා ගැනීමේදී අදාළ වන පරිපාටිය හා එවැනි දරුවකුගේ නෛතික තත්වය පිළිබඳව ඔස්මන්ඩ් ඔබගෙන් උපදෙස් පතයි.

(අ) ඔහුට උපදෙස් දෙන්න.
(ආ) ඔස්මන්ඩ් සහ ඉරේෂා ශ්‍රී ලාංකික මුස්ලිම් වන්නේ නම් ඔබගේ පිළිතුර වෙනස් වේද ?

හිමිකම් ඇවිරිණි.